**තිරප්පනේ ප්‍රාදේශීය සභාව**

**2022.01.11 වන දින පෙ.ව.10.00 ට පැවති මහ සභා රැස්වීම් වාර්තාව**

***පැමිණි සිටි ගරු මන්ත්‍රීවරුන්:***

| | | |
|---|---|---|
| 1. | ඩබ්.රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා | - ගරු සභාපති තුමා |
| 2. | වයි.එම්.තවුපික් මැතිතුමා | - ගරු උප සභාපති තුමා |
| 3. | ඒ.අන්වර් සදාක් මැතිතුමා | - ගරු සභික තුමා |
| 4. | එස්.තිස්ස විජේසිංහ මැතිතුමා | - ගරු සභික තුමා |
| 5. | පී.මධුර කුමාර පියරත්න මැතිතුමා | - ගරු සභික තුමා |
| 6. | එච්.එම්.නාසිම් මැතිතුමා | - ගරු සභික තුමා |
| 7. | පී.නිමල් රාජපක්ෂ මැතිතුමා | - ගරු සභික තුමා |
| 8. | බී.ආර්.තිලක් සුසන්ත රාජකරුණා මැතිතුමා | - ගරු සභික තුමා |
| 9. | ආර්.ප්‍රියංගන ප්‍රසාද් කුමාර රත්නායක මැතිතුමා | - ගරු සභික තුමා |
| 10. | එච්.බී.නලින් හේරත් මැතිතුමා | - ගරු සභික තුමා |
| 11. | ආර්.පී.නිසංසලා ලක්මාලි අබේරත්න මැතිණිය | - ගරු සභික තුමිය |
| 12. | ඒ.පී.මරියාහාමි මැතිණිය | - ගරු සභික තුමිය |
| 13. | කේ.නදිකා සෙව්වන්දි කරුණාරත්න මැතිණිය | - ගරු සභික තුමිය |
| 14. | ජේ.රෝහණ විජයතිලක මැතිතුමා | - ගරු සභික තුමා |
| 15. | ටී.එම්.තිළිණ රසාංග තිලකරත්න | - ගරු සභික තුමා |

***නොදන්වා නොපැමිණි ගරු මන්ත්‍රීවරුන්:***

| | | |
|---|---|---|
| 1. | එන්.රශ්මි සංකල්පනා මැතිණිය | - ගරු සභික තුමිය |

***සහභාගි වූ නිලධාරීන්:***

| | | |
|---|---|---|
| 1. | ආර්.පී.පී.රේණුකා ලියනගේ මිය | - ලේකම් |
| 2. | කේ.බී.අක්ෂිලා සුජීවනී බණ්ඩාර මිය | - විෂය ලිපිකරු |

**(අ) පසුගිය රැස්වීම් වාර්තා සම්මත කිරීම.**

- **2021.12.23 වන දින පැවති ගරු මහ සභා වාරයේ වාර්තාව සභා සම්මත කිරීම.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

අද දිනට නියමිත ගරු මහ සභාවේ න්‍යාය පත්‍රයේ මුලින්ම තිබෙන්නේ 2021.12.23 වන දින පැවති ගරු මහ සභාවේ සභා වාර්තාව සභා සම්මත කරගැනීමයි. ඒ අනුව පසුගිය සභා වාර්තාවට සංශෝධන තිබේනම් ඒවා ඉදිරිපත් කරන ලෙසත්, පසුගිය සභා වාර්තාව සභා සම්මත කර ගන්නා ලෙසත් මම ගරු මහ සභාවට ඉදිරිපත් කරනවා.

**<u>යෝජනා අංක 01-01-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මුලින්ම සියළුම දෙනාට ලැබුවා වූ අළුත් අවුරුද්ද සුභ අළුත් අවුරුද්දක් වේවායි කියා මම ප්‍රාර්ථනා කරනවා. ඒ වගේම මෙම වසරේ සුභවාදී ගමනක් යන්න ශක්තිය ධෛර්ය ලැබේවායි කියා මම ප්‍රාර්ථනා කරනවා.

2021.12.23 වන දින පැවති ගරු මහ සභා වාර්තාවේ සංශෝධනයක් තියෙනවා. පිටු අංක 08 හි 184 වෙනි යෝජනාවෙහි ස්ථිරත්වය ඒ.අන්වර් සදාක් මැතිතුමා කියායි තියෙන්නේ. එය බී.ආර්.ටී.එස්.රාජකරුණා මැතිතුමා ලෙස නිවැරදි විය යුතුයි. පිටු අංක 02 හි ඒකමතිකව සම්මත විය යනුවෙන් සඳහන් වෙලා තියෙනවා. ඒක පැමිණි සිටි මන්ත්‍රිවරුන්ගෙන් ලෙස නිවැරදි විය යුතුයි. පිටු අංක 03 හි 176 වන යෝජනාවෙහි ප්‍රධාන ශාලාව ලෙස සඳහන් විය යුතුයි. මෙම සියළු සංශෝධනයන්ට යටත්ව 2021.12.23 වන දින පැවති ගරු මහ සභාවේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.ටී.එස්.රාජකරුණා මැතිතුමා</u>**

ගරු සභාපතිතුමනි, සියළුම දෙනාට සුභ නව වසරක් වේවා කියා මම ප්‍රාර්ථනා කරනවා. සංශෝධනයන්ට යටත්ව 2021.12.23 වන දින පැවති ගරු මහ සභාවේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු තිස්ස විජේසිංහ මැතිතුමා ගෙනා යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් 2021 දෙසැම්බර් මස 23 වන දින පැවති ගරු මහ සභාවේ වාර්තාව පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.*

*<u>2021.12.23 වන දින පැවති ගරු මහ සභාවේ වාර්තාවේ සංශෝධනය විය යුතු කොටස.</u>*

- **<u>පිටු අංක 02 හි.</u>**

**<u>යෝජනා අංක 175-12-2021.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, 2021.11.25 වන දින පැවති ගරු මහ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - පී.නිමල් රාජපක්ෂ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් 2021 නොවැම්බර් මස 25 වන දින පැවති ගරු මහ සභාවේ වාර්තාව පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.*

➢ **<u>පිටු අංක 03 හි.</u>**

**<u>ලිපි අංක - I.</u>**

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

පළාත් පාලන බල ප්‍රදේශය තුල කුඩා සිනමා ශාලාවන් ඉදිකිරීම සඳහා පළාත් පාලන ආයතන බල ප්‍රදේශය සතුව පවතින සිනමා ශාලාවක් ගොඩනැගීමට සුදුසු ගොඩනැගිලි හෝ හිස් ඉඩම් පවතී නම් ඒ බව ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව වෙත දැනුම් දෙන ලෙස යොමු කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

**<u>යෝජනා අංක 176-12-2021.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, අපිට මේක හොඳ අවස්ථාවක්. අපිට සේවා අවශ්‍යතාවය සඳහා තියාගෙන සභාවේ ප්‍රධාන ශාලාව සිනමා ශාලාවක් සඳහා ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා උප සභාපති - වයි.එම්.තවුපික් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

➢ *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

➢ **<u>පිටු අංක 08 හි.</u>**

**<u>යෝජනා අංක 184-12-2021.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, වර්ෂ අවසානය නිසා වැඩ වැඩියි. එම නිසා අත්‍යාවශ්‍ය සේවාවන් සඳහා සේවා අවශ්‍යතාවයන් මත අධීක්ෂණය යටතේ අතිකාල දීමනා ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.ටී.එස්.රාජකරුණා මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

➢ *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>(ආ) ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන.</u>**

අද දින විශේෂ නිවේදන අවස්ථාව යටතේ මට කියන්න තියෙන්නේ පළාත් පාලන අමාත්‍යාංශය, ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යංශය, පළාත් පාලන දෙපාර්තමේන්තුව ඇතුළු විවිධ ආයතන හරහා අප වෙත ලැබුණු ව්‍යාපෘති වලින් ව්‍යාපෘති විශාල ප්‍රමාණයක් අපි නිම කළා. නමුත් තව ව්‍යාපෘති 45 ක් පමණ ක්‍රියාත්මක කිරීමට තියෙනවා. මෙම ව්‍යාපෘති වල කාලය දීර්ඝ කිරීමට අපි ඉල්ලා තිබෙනවා.

ඒවගේම මේ දිනවල ඩෙංගු මර්දන වැඩසටහන් ක්‍රියාත්මක වෙනවා. ඒ සඳහාත් සියළුදෙනාගේ සහයෝගය ලබාදෙන්න.

කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා UNDP එකෙන් අපිට පෙරටු කාර්යාල ව්‍යාපෘතිය ප්‍රදානය කළා. යම් යම් කාරණා සිදුකරන්න වෙයි. අපිට මේ හරහා මහජනතාවට හොඳ සේවාවක් ලබදෙන්න පුළුවන්.

**<u>(ඈ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන මහ සභාවට ඉදිරිපත් කිරීම.</u>**

- ආදායම් පරීක්ෂක මහතාගේ 2021 දෙසැම්බර් මස ආදායම් වාර්තාව ගරු මහ සභාවේ දැනගැනීම සඳහා මම ඉදිරිපත් කරනවා.

- රියදුරන් වෙත රාජකාරි පැවරීම සියළුමදෙනා දැනුවත් කළ ලිපිය ගරු මහ සභාවේ දැනගැනීම සඳහා මම ඉදිරිපත් කරනවා.

**<u>(ඇ) යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න.</u>**

කිසිවක් නොමැත.

**<u>(ඉ) යථා පරිදි කල්දී ඇති යෝජනා.</u>**

**<u>ලිපි අංක - I.</u>**

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

කාර්ය සාධන අරමුදලෙන් (PT-1) පහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සභා අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

- NCZA-5190 ලෝඩර් බැකෝ යන්ත්‍රය අළුත්වැඩියාව හා සේවා කිරීම.
- NCPF-5497 දරණ කැබ් රථයේ කැනපිය සැකසීම.
- බල ප්‍රදේශයේ විදුලි පහන් නොමැති ස්ථාන සඳහා වීථි පහන් සපයා සවි කිරීම.
- අංක 252-6495 කැබ් රථය පූර්ණ අළුත්වැඩියා කිරීම.

**<u>යෝජනා අංක 02-01-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, අපේ සභාවේ වාහන නිසි නඩත්තු කිරීමක් හා රියදුරන් වෙත විධිමත්ව රාජකාරි නොපැවරීම හේතුවෙන් ඉතාම අබලන් තත්ත්වයේ තියෙන්නේ. දැන් අපි වගකීම නිසි අයුරින් පවරලා තියෙනවා. එතකොට අදාල අය වගකීමෙන් බැදෙනවා. අපි මහජනතාවට සේවා සපයන ආයතනයක්. අපි බල ප්‍රදේශයේ මහජනතාවට හොඳ සේවාවක් සපයන්න ඕනේ. ඒ අනුව කාර්ය සාධන අරමුදලෙන් (PT-1) NCZA-5190 ලෝඩර් බැකෝ යන්ත්‍රය අළුත්වැඩියාව හා සේවා කිරීමත්, NCPF-5497 දරණ කැබ් රථයේ කැනපිය සැකසීමත්, අංක 252-6495 කැබ් රථය පූර්ණ අළුත්වැඩියා කිරීමත් බල ප්‍රදේශයේ විදුලි පහන් නොමැති ස්ථාන සඳහා වීථි පහන් සපයා සවි කිරීමත් සුදුසු බවට මම යෝජනා කරනවා. ඒවගේම වාහන අළුත්වැඩියා කිරීමේදී අදාල වාහනය භාර රියදුරු එම ස්ථානයේ සිට අඩුපාඩු පෙන්වා දී වාහනය සකස් කරගැනීම සුදුසු බවටත් මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, තිස්ස මන්ත්‍රීතුමා ගෙනා යෝජනාවට මම එකඟවෙන්නේ නෑ. මේවා නිවැරදි කරගන්න අපි ලොකු උත්සහයක් ගත්තා. නමුත් අපිට මේක නිවැරදි කරගන්න බැරි වුනා. මේවා නිශ්චිත පූර්ණ පරීක්ෂාවක් කරලා නිවැරදි කරගන්න ඕනේ. අවුරුදු 04 ක්ම මේක නිවැරදි වුනේ නෑ. මේවා මහජන බදු මුදල්.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - පී.මධුර කුමාර පියරත්න මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මීට පෙරත් මේ වාහන හදපු එක ඇත්ත. මැතකදී ඉංජිනේරු මහතා සභාවට ආවා. 252-6495 දරණ කැබ් රථය එතුමාගේ නිර්දේශය අනුව හැදුවා. නමුත් ඒක හරියට හදලා නෑ සභාවේ අප්‍රසාදයක් තමයි ඒ සම්බන්ධයෙන් තියෙන්නේ කියලා මම කිවුවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, වාහන ගැන මන්ත්‍රීවරු අදහස් දැක්වුවා. ගරු රෝහණ මන්ත්‍රීතුමා කියන කාරණය හරි. නමුත් අපි දැන් ක්‍රමක්‍රමයෙන් මේක නිවැරදි කිරීමට කටයුතු කරමින් යනවා. දැන් වාහන වලට නිසි භාරකාරීත්වයක් තියෙනවා. දැන් වාහන අවභාවිතාවීම අඩුයි. අංක 252-6495 කැබ් රථයට නිත්‍ය රියදුරෙක් ඉන්නවා. ඒවගේම වැඩ ආවරණය කරන්න රියදුරෙකුත් ඉන්නවා. ඒ දෙන්නා හැර වෙන අයට මෙම වාහනය ගෙනියන්න බෑ. එහෙම නොවෙනවානම් ඔබතුමන්ලා සොයා බලන්න. ඒවගේම අනෙකුත් වාහනත් එහෙමයි. දැන් නිසි අයුරින් රාජකාරී පවරලා තියෙන්නේ. මම විශේෂයෙන් මාර්ග තලනය භාරව කටයුතු කරන රවින්ද්‍ර මහතාට ස්තුතිවන්ත වෙන්න ඕනේ. මොකද එතුමා නිවාඩු නොගෙන පසුගිය දිනවල එකදිගටම වැඩ කළා. විශාල ආදායමක් හෙව්වා. දැන් නිසි අධීක්ෂණයක් යටතේ වාහන ධාවනය කරන්න පුළුවන්. මම කියන්නේ මේවට විරුද්ධ වෙන්න එපා. වාහන ටික හදලා නිසි ක්‍රමවේදයකින් නිවැරදිව ගමනක් යමු. අපි මහජනතාවට සේවා සපයන ආයතනයක්. ඒනිසා අපිට යන්ත්‍ර සූත්‍ර අවශ්‍යයි.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, ගරු තිස්ස මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව ගරු ප්‍රාදේශීය සභා සභික ජේ.රෝහණ විජයතිලක මැතිතුමා මේ සඳහා විරෝධතාවය පල කල අතර, පැමිණි සිටි අනෙකුත් සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - II.</u>**

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ පහත නම් සඳහන් සේවකයන්ගේ 2021 දෙසැම්බර් හා 2022 පෙබරවාරි මාස වලට අදාල අතිකාල දීමනා තක්සේරු වාර්තා අනුමත කරගැනීම සඳහා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

| අනු අංකය | නම | තනතුර | 2021 දෙසැම්බර් මස ඉල්ලුම් කරන අතිකාල පැය ගණන | 2022 පෙබරවාරි මස ඉල්ලුම් කරන අතිකාල පැය ගණන |
|---|---|---|---|---|
| 01 | එස්.එම්.ආර්.එස්.පී.කේ.උඩුගොඩ මිය | සංවර්ධන සහකාර | - | 36 |
| 02 | ආර්.එම්.කේ.චන්ද්‍රසිරි මෙනවිය | ගිණුම් සහකාර | - | 60 |
| 03 | එස්.සුමිත් දිසානායක මයා | රියදුරු | - | 50 |
| 04 | අජිත් කුමාර වනසිංහ මයා | මුරකරු | 75 | 60 |
| 05 | දිනේෂ් සංජය රුද්දිගු මයා | මාර්ග කම්කරු | - | 75 |
| 06 | ජේ.කුමාරසිංහ මයා | මාර්ග කම්කරු | - | 75 |
| 07 | ජේ.එස්.ප්‍රියංකර මයා | සෞඛ්‍ය කම්කරු | - | 75 |

**<u>යෝජනා අංක 03-01-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, සේවා අවශ්‍යතාවය මත නිසි අධීක්ෂණයකින් යුතුව අතිකාල දීමනා ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ලිපි අංක - III.</u>**

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

2022 වර්ෂය සඳහා නිල ඇඳුම් දීමනාව ලබාදීමට අවශ්‍ය අනුමැතිය ඉල්ලා ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

**<u>යෝජනා අංක 04-01-2022.</u>**

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, 2022 වර්ෂය සඳහා නිල ඇඳුම් දීමනාව ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා. මේක සේවකයන් ලැබිය යුතු වරප්‍රසාදයක්. ගිය වර්ෂයේ ඒවත් ලබාදීමට හැකිනම් ලබාදෙන ලෙසත් මම ඉල්ලීමක් කරනවා.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - IV.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

2022 වර්ෂය සඳහා නාවිවාදුව ෂෝගාතකාගාරය මුදල් ලබාගෙන පරිහරණය කිරීම සඳහා අවසර ලබා ගැනීම සම්බන්ධයෙන් නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමන් විසින් යොමු කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තිරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

**යෝජනා අංක 05-01-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මුදලක් අයකරගෙන නාවිවාදුව ෂෝගාතකාගාරය පරිහරණය කිරීම සඳහා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට අවසර ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, ගරු අන්වර් සදාක් මන්ත්‍රීතුමා මුදලක් සඳහන් කළේ නෑ. මම ඒකට සංශෝධනයක් එකතු කරමින් රුපියල් ලක්ෂ දෙකක (රු.200000.00 ක) මුදලක් අයකරගෙන නාවිවාදුව ෂෝගාතකාගාරය පරිහරණය කිරීම සඳහා නැගෙනහිර නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවට අවසර ලබාදීම සුදුසු බවට ගෙනා යෝජනාව ස්ථිර කරනවා.

**යෝජනා අංක 06-01-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, දැන් තියෙන වාතාවරණයත් එක්ක එම මුදල ගෙවන්න අමාරුයි. එම නිසා රුපියල් එක්ලක්ෂ විසිපන්දාහක මුදලට (රු.125000.00 ක) ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එච්.එම්.නාසිම් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එච්.බී.නලින් හේරත් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, සියළුමදෙනාට සුභ නව වසරක් වේවා කියා මම ප්‍රාර්ථනා කරනවා. ප්‍රාදේශීය සභා වල කාලය 2023 මාර්තු දක්වා දීර්ඝ කරලා තියෙනවා. ගරු සභාපතිතුමනි, මම කියන්නේ ගරු තිස්ස මන්ත්‍රීතුමා කිවුවා රුපියල් ලක්ෂ දෙකක (රු.200000.00 ක) මුදලක් අයකරගෙන ලබාදීම සුදුසුයි කියලා. මමත් ඒ යෝජනාව ස්ථිර කරනවා. ලක්ෂ 02 කට යා යුතුයි.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

දැන් මේකට යෝජනා 02 ක් තියෙනවා. අපි ඡන්දයක් තියමු.

**ගරු උප සභාපති - වයි.එම්.තවුපික් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මේකට සාධාරණයක් තිබිය යුතුයි. මෙම මුදල වැඩි කරාම පාරිභෝගිකයාගෙන් තමයි ඒක අයකරන්නේ. සෑම සභාවක්ම වැඩිම ආදායමක් ලබන්නේ මස් කඩ වලින්. රුපියල් එක්ලක්ෂ විසිපන්දාහක මුදලක් (රු.125000.00 ක්) අයකර ලබාදීම තමයි සුදුසු.

**යෝජනා අංක 07-01-2022.**

**ගරු ප්‍රාදේශිය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ඔබතුමන්ලා මුදලක් නැතිව තමයි යෝජනා කළේ. මම ඒකට මුදලක් දාලා ස්ථිර කරා. මස් කඩ වල අඩුපාඩු තියෙනවා නම් අපි ඒවා සභාවෙන් හදලා දෙන්න ඕනේ. මේකට රුපියල් ලක්ෂ පහක (රු.500000.00 ක) මුදලක් අයකිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශිය සභා සභික - පී.නිමල් රාජපක්ෂ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මම ඒ යෝජනාව ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශිය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. මේක පාලනය කරන්න.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

එක් වරකට එක් මන්ත්‍රීවරයෙක් පමණක් කථා කරන්න.

**ගරු ප්‍රාදේශිය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, අපිට ස්ථිර ඝෝශාතකාගාරයක් නෑ. නීත්‍යානුකූල ඉඩමක් නෑ. හැම වර්ෂයකම අපි මේකෙන් ආදායමක් ලබාගත්තා. නැනුප සභාව දැන් තැන් කීපයකම ඉඩම් බලලා තියෙන්නේ. එයාලා ඒක හදාගත්තාම මේක ඉල්ලන්නේ නෑ. අපේ කඩේ හදන්න අපි සෑහෙන මුදලක් වියදම් කළා. දායක සභාවෙන් අපි ඒකත් කළා. සභාවට බරක් දුන්නෙත් නෑ. එම නිසා නැනුප සභාවට රුපියල් එක්ලක්ෂ විසිපන්දාහක මුදලක් (රු.125000.00 ක්) අයකර නාවිවාදූව ඝෝශාතකාගාරය ලබාදීම සුදුසු බවට මම නැවතත් යෝජනා කරනවා.

**යෝජනා අංක 08-01-2022.**

**ගරු ප්‍රාදේශිය සභා සභික - බී.ආර්.ටී.එස්.රාජකරුණා මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, ප්‍රාදේශිය සභාවක් විදියට සියළුම ජනතාව ගැන සානුකම්පිතව බලන්න ඕනේ තමයි. එම නිසා අපි කාරක සභාවක් බවට පත් කරලා මේගැන කථා කරමු. ගරු මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශිය සභා සභික - ආර්.පී.නිසංසලා ලක්මාලි අබේරත්න මැතිණිය.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

- කාරක සභා අවස්ථාව.

**යෝජනා අංක 09-01-2022.**

**ගරු ප්‍රාදේශිය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

කාරක සභාව ගරු මහ සභාවක් බවට පත් කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශිය සභා සභික - කේ.නදිකා සෙව්වන්දි කරුණාරත්න මැතිණිය.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**යෝජනා අංක 10-01-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, අපි දිගින් දිගටම මේගැන කථා කළා. අපි මස් කඩේට අවශ්‍ය පහසුකම් ලබාදෙමු. ඉඩම් කොටසක් හොයා ගන්නත් අපි උත්සහ ගමු. නිලධාරීන් කරන්නෙත් ගනුදෙනු රජයේ දේකට සහාය දෙන්නේ නෑ. ඔබතුමන්ලාත් ඉඩමක් හොයන්න බලන්න. මේ සියලුදේට යටත්ව රුපියල් එක්ලක්ෂ විසිපන්දාහක මුදලක් (රු.125000.00 ක්) අයකර නාවිවාදුව ෂෝගාතකාගාරය ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා. ලබන අවුරුද්දේ නම් අනිවාර්යෙන්ම මෙම මුදල වැඩි වෙන්න ඕනේ.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු උප සභාපති - වයි.එම්.තවුපික් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, අපි මස් කඩ කාරයෝ නෙමෙයි ඉඩම් හොයන්න. ඒක සභාවෙන් කරන්න ඕනේ.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එච්.බී.නලින් හේරත් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මම මගේ පෞද්ගලික විරෝධතාවය මේ සඳහා ප්‍රකාශ කරනවා. මම මේ මුදලට කැමති නෑ.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව ගරු ප්‍රාදේශීය සභා සභික එච්.බී.නලින් හේරත් මැතිතුමා මේ සඳහා විරෝධතාවය පල කල අතර, පැමිණි සිටි අනෙකුත් සභිකවරුන්ගේ එකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**ලිපි අංක - V.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

NCLL-7713 දරණ කෲ කැබ් රථයේ පහත සඳහන් අඩුපාඩු සකස් කොට ධාවනය කිරීමට සුදුසු තත්ත්වයට අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති ලිපිය ගරු මහ සභාවේ සුදුසු තීරණයක් ගැනීමට ඉදිරිපත් කර සිටිනවා.

- ඉදිරි පස පිටුපස ටයර් යෙදීම.
- ඉදිරි පස පිටු පස දොර ලොක් සෑදීම.
- ඉදිරි පස පිටු පස ආසන කුෂන් කර අළුත්වැඩියා කිරීම හා අනෙකුත් අළුත්වැඩියාවන්.

**යෝජනා අංක 11-02-2022.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, කෲ කැබ් රථය ගමන් කිරීමට සුදුසු මට්ටමක නෑ. ටයර් ඉතාම අබලන් තත්ත්වයේ තියෙන්නේ. එම නිසා එහි සියළුම අඩුපාඩු යොදා සකස් කර අළුත්වැඩියා කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, මස් කඩ වලට ගහ ගත්තේ නැති එක විතරයි. නමුත් සභාවේ දේකට කවුරුත් කථා කරන්නේ නෑ. මේවා සභාවේ සම්පත් නෙමෙයිද?. න්‍යාය පත්‍රයෙන් පිට ලිපි දානවා. ඒවගේම තමයි මේ වාහන හදන්න කී පාරක් යෝජනා කරාද?. මම දන්නේ නෑ මේකේ පරිපාලනය කොහොම වෙනවද කියලා. මගේ යෝජනාව තමයි මන්ත්‍රීවරු වාහන පිළිබඳවත් හොයන්න කියන එක.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, කෘෂ කැබ් රථයේ සියළුම අඩුපාඩු යොදා සකස් කර අළුත්වැඩියා කිරීම සුදුසු බවට ගරු තිස්ස මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවූයෙන් පැමිණි සිටි සභිකවරුන්ගේ ඒකඟතාවයෙන් මෙම යෝජනාව සභා සම්මත විය.*

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.ටී.එස්.රාජකරුණා මැතිතුමා.</u>**

ගරු රෝහණ මන්ත්‍රීතුමා කියපු දේට අදහසක් දක්වන්න ඕනේ. මේ සභාවේ ඔබතුමා යෝජනාවක් කරනවා නම් යෝජනා කරන්න. ටියුෂන් දෙන්න ඕනේ නෑ.

**<u>ගරු ප්‍රාදේශීය සභා සභික - එච්.බී.නලින් හේරත් මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, රියදුරු මහතුන් කීපදෙනෙක් මෙම ආයතනයේ ඉන්නවා. මෙයාලගේ ආකල්පමය වෙනසක් ඇති කළ යුතුයි. මේ වාහන තමන්ගේම වාහන වගේ තියාගන්න ආකල්පමය වෙනසක් ඇති කළ යුතුයි. මෙතනට එයාලා ගෙනල්ලා හරි කමක් නෑ ආකල්පමය වෙනසක් ඇති කරන්න. තමන්ගේම කියන හැඟීම ඇති කරන්න ඕනේ. මටත් වාහන කීපයක් තියෙනවා. එම වාහන වල රියදුරන්ට මම මාසයකට සැරයක් කථා කරනවා. එයාලා හොඳට වාහන තියොගෙන ඉන්නවා. මට හරි කියන්න මම හරි ඒ දේ කරන්නම්. රියදුරු මහතුන්ට මම කථා කරලා මේ ආකල්පමය වෙනස ඇති කරන්නම්. නැත්නම් මේ වාහන කොච්චර හැදුවත් වැඩක් නෑ. භාවිතා කරන විදිය හොඳ නැත්නම්.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

අපි යාන්ත්‍රික ඉංජිනේරු මහතාගෙන් ඉල්ලීමකුත් කරා. එතුමාත් ගෙන්නලා අපි මේ සාකච්ඡාව තියමු.

**<u>ගරු උප සභාපති - වයි.එම්.තවුපික් මැතිතුමා.</u>**

වාහන සම්බන්ධයෙන් අපි කොච්චර කථා කළාද?. සේවකයෝ ගෙනල්ලා අපි කී පාරක් කථා කළාද?. මෙතන වෙන්නේ මේක ක්‍රියාත්මක වෙන්නේ නැති එකයි. ට්‍රැක්ටරයක් හදන්න ලක්ෂ 05 ක් විතර ගියා. දැන් ආයේ පැත්තකට දාලා තියෙනවා. වාහන ගැන හැමදාම කථා කරනවා. කාර්මික කමිටුවෙත් කථා කරනවා. මෙතන වෙන්නේ ක්‍රියාත්මක කරන්නේ නැති එකයි. ලේකම්තුමියත් හරියට ඉන්න ඕනේ.

**<u>ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.</u>**

අපිට නිත්‍ය රියදුරෝ දෙන්නයි ඉන්නේ. අනිත් අය අනියුක්ත කරගෙන ඉන්නේ. එයාලා සෞඛ්‍ය කම්කරු මාර්ග කම්කරු අය. එයාලට වාහන පිළිබඳ දැනුමක් නෑ. දැන් අපි ඒක නීත්‍යානුකූල කරලා තියෙන්නේ.

**(ඊ) කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.**

**2021.12.03 වන දින පැවති මුදල් ප්‍රතිපත්ති සම්පාදන හා ප්‍රසම්පාදන කමිටු වාර්තාව.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

2021.12.03 වන දින පැවති මුදල් ප්‍රතිපත්ති සම්පාදන හා ප්‍රසම්පාදන කමිටු වාර්තාව ගරු මහ සභාවේ දැනගැනීම සඳහා මම ඉදිරිපත් කර සිටිනවා.

**2021.12.17 වන දින පැවති කාර්මික කමිටු වාර්තාව.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

2021.12.17 වන දින පැවති කාර්මික කමිටු වාර්තාව ගරු මහ සභාවේ දැනගැනීම සඳහා මම ඉදිරිපත් කර සිටිනවා.

**2021.12.20 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

2021.12.20 වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව ගරු මහ සභාවේ දැනගැනීම සඳහා මම ඉදිරිපත් කර සිටිනවා.

**(උ) ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ ඉදිරිපත් කිරීම.**

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

2021 දෙසැම්බර් මස ආදායම් අය කර ගැනීම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව (එල්.ජී.13) ගරු මහ සභාවේ දැනගැනීම සඳහා මෙන්ම අනුමැතිය සඳහා ද ඉදිරිපත් කරනවා.

**යෝජනා අංක 12-01-2022.**

**ගරු ප්‍රාදේශිය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

2021 දෙසැම්බර් මස ආදායම් අය කර ගැනීම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව (එල්.ජී.13) සත්‍ය වාර්තා බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශිය සභා සභික - බී.ආර්.ටී.එස්.රාජකරුණා මැතිතුමා.**

එම යෝජනාව මම ස්ථිර කරනවා.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

මේ සඳහා විරෝධතා තිබෙනවා නම් ඉදිරිපත් කරන ලෙස මම ගරු මහ සභාවෙන් ඉල්ලා සිටිනවා.

- *ඉන්පසු ගරු සභාපතිතුමා සභාව විමසීමෙන් අනතුරුව විරෝධතා කිසිවක් ඉදිරිපත් නොවුයෙන් 2021 දෙසැම්බර් මස ආදායම් අය කර ගැනීම පිළිබඳ මාසික ප්‍රගති වාර්තාව (එල්.ජී.06) හා මාසික වියදම් වාර්තාව (එල්.ජී.13) පැමිණි සිටි සභිකවරුන්ගේ එකඟතාවයෙන් සභා සම්මත විය.*

**(ඌ) නොපැමිණෙන මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අවසර ලිපි ඉදිරිපත් කිරීම.**

කිසිවක් නැත.

**(එ) ගරු සභිකවරුන්ගේ වෙනත් අදහස් ඉදිරිපත් කිරීම.**

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, සංචාරක හෝටල් වලින් ඇස්තමේන්තු කරලා තියෙනවා ලක්ෂ දහ අටක්. ඒකේ තත්ත්වය කොහොමද?.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

අපි නඩු දාලා තියෙන්නේ නඩුව මැයි මාසේ 27 වෙනිදාට කල් ගිහින් තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, වාහන ගැන අපි තව තවත් හොයන්න ඕනේ. මේවා නිවැරදි වෙන්න ඕනේ. අපි ඉදිරියේදී මේක හොයලා බලමු. මීට කලින් ඩීසල් ප්‍රශ්නයක් තිබුණා. අපිට කවුරුත් කිව්වේ නෑ. මොනවා හරි අකටයුත්තක් වුනොත් අපි සභාවේ තීරණයක් ගන්න ඕනෙ. කවුරු හරි වරදක් කළොත් මහ සභාවෙන් යෝජනාවක් අරගෙන සේවයෙන් පහකිරීමට කටයුතු කළ යුතුයි. මේ සඳහා නීත්‍යානුකූල පියවර ගන්න.

**ගරු උප සභාපති - වයි.එම්.තවුපික් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මම අවුරුදු 03 ක් මුදල් කමිටුවේ හිටියා. කාර්මික කමිටුවේත් හිටියා. නමුත් මෙවර මුදල් කමිටුවෙන් මාව අයින් කරලා. මම කාර්මික කමිටුවෙනුත් අයින් වෙනවා. එම නිසා මම කාර්මික කමිටුවෙන් ඉල්ලා අස්වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මම සභාවට ටියුෂන් දෙන්න ගියේ නෑ. මම මේකට මගේ කණගාටුව ප්‍රකාශ කරනවා. අනිත් හැම සභාවක්ම ජනතාවට ප්‍රසිද්ධියේ යන්නේ. එතකොට තමයි ජනතාව ඒ අයව ඊලඟ සභාවට යවන්නේ. මේවෙනකොට කොච්චර අමාත්‍යාංශ ප්‍රමාණයක් අකාර්යක්ෂම වෙලා තියෙනවාද?. ජනතා විමුක්ති පෙරමුණේ කාටද මූල්‍ය චෝදනා තියෙන්නේ. කාටවත්ම නෑ.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එස්.තිස්ස විජේසිංහ මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, කමිටු ශක්තිමත් වෙන්නනම් කමිටු වලට සක්‍රියව දායක වෙන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ආර්.පී.කේ.රත්නායක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, වාහන වලට ඉන්ධන ගහනකොට දවසකට ගහන ප්‍රමාණයක් තියෙනවාද? ඔය අතරේ ඩීසල් මාපියාවක් වෙනවා නම්. ජනවාරි 6 වෙනිදා මම සාක්ෂි ඇතුව ඔප්පු කරන්නම්. එවගේම මම කියන්න කැමතියි මමත් අවුරුදු 02 ක් පරිසර කමිටුවේ සභාපතිවරයා විදියට කටයුතු කරලා තියෙනවා. මේදිනවල පාසල් පටන් අරගෙන තියෙන්නේ. මම ඉල්ලීමක් කරනවා පාසල් වල ක්‍රීඩා පිටි කපන්න මැෂින් එකක් ගෙනල්ලා දෙන්න කියලා. සමහර පාසල් වලින් මුදල් ගෙවන්න කැමතියි.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ගරු මන්ත්‍රීතුමා වාහන වලට ඉන්ධන ගහලා කොච්චර ප්‍රමාණයක් ධාවනය කරනවාද කියලා ධාවන සටහන් පොතේ සටහන් කරනවා. ඔබතුමා ඔය කියන දේ මට සාක්ෂි ඇතුව කියන්න.

ඒවගේම තමයි අපි පාසල් වල තණකොල කපන්න මැෂින් එකක් ගෙන්නුවා. නමුත් සමහර පාසල් මුදල් ගෙවන්න කැමති නෑ.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ඒ.අන්වර් සදාක් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, අපේ ගම් ප්‍රදේශයේ ඉතාම ලඟ ලඟ නිවාස ඉදිකරලා තියෙනවා. ගලි බවුසරයක් නැතිව ජනතාව විශාල අපහසුතාවයකට පත් වෙලා ඉන්නේ. ගලි බවුසරයක් ගැනීමට අවශ්‍ය කටයුතු කරන්න කියලා මම ඉල්ලීමක් කරනවා. ඒවගේම තමයි සභාව තියෙන මෙම උඩු මහලේ එහා පැත්තෙන් වැටක් ගහන්න කියලත් මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - ජේ.රෝහණ විජයතිලක මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, උඩ වැසිකිලි පද්ධතිය පිරිසිදු කරලත් නෑ. ඒවගේම දිනපොතක් දීම ගැන මම විශේෂ ස්තුතියක් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - එච්.බී.නලින් හේරත් මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, සභාව උදේ 9.00 ට දැම්මනම් හොඳයි කියලා මම ඉල්ලීමක් කරනවා. ඒවගේම මම කියන්න කැමතියි මේ AC මැෂින් පහ විකුණලා දැම්මා නම් මීට වැඩිය හොඳයි. දැන් අවුරුදු 04 ක් තිස්සේ මේක මෙහෙමමයි. මේවා භාවිතා කරන්න පුළුවන් විදියට හදන්න. මොකද දැන් මේවා විශාල මිලක් වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභික - බී.ආර්.ටී.එස්.රාජකරුණා මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, අංක 546 කට්ටමුරිච්චාන තුලානේ සන්දනම්කුලම ගමේ කිරි ගොවියන්ට ප්‍රශ්නයක් තියෙනවා. කිරි ගවයන්ට ඉන්න තැනක් නෑ. ගොවිබිම් හසුනොවන ආකාරයට ගවයින්ට තණකොල කන්න භූමියක් ලබාදීමට හැකිනම් ඒක ලොකු දෙයක්. මේගැන සොයා බලන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපති - රොෂාන් ප්‍රියදර්ශන ඉලංගසිංහ මැතිතුමා.**

ඒ අනුව අද දින සභාවේ වැඩ කටයුතු වලට සහභාගිවී සහයෝගය ලබාදුන් සියළුම දෙනාට ස්තුතිවන්ත වන අතර, අද දිනට සභාවේ වැඩ කටයුතු හමාර කරනවා. ස්තුතියි.

2022.01.11 වන දින පැවති ගරු මහ සභාවේ වැඩ කටයුතු ප.ව.12.15 ට පමණ අවසන් විය.